## අයදුම්පත පිරවීම සඳහා උපදෙස් පත්‍රිකාව

**පොදු උපදෙස් :**

1. අයදුම්පතේ ඉල්ලා ඇති සියලුම ලේඛනවල ඡායා පිටපත් සත්‍ය පිටපත් ලෙස සාමදාන විනිශ්චයකාරවරයකු / රාජ්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය. (නිල මුද්‍රාව සහිතව)
2. බැංකුවට පිළිගත හැකි පුද්ගල ඇප දෙකක් සපයා ගත හැකි ව්‍යවසායකයින් පමණක් මෙම ණය ඉල්ලුම් කිරීම මගින් ණය ලබා දීමේ ක්‍රියාවලිය අතරතුර සිදුවන අපහසුතා මඟ හරවා ගත හැකි බව කරුණාවෙන් සලකන්න.
3. අයදුම්පත්‍රයේ අංක,
   - 01 සිට 07 දක්වා අයදුම්කරු විසින් ද
   - 8.1 ව්‍යවසායකයා පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් ද
   - අවශ්‍ය වේ නම් 8.2 අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් ද සම්පූර්ණ කළ යුතුය.

### 01. මූලික තොරතුරු

1.1 නම : ජාතික හැඳුනුම්පතෙහි සඳහන් පරිදි දක්වන්න.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : සහතික කළ ඡායාපිටපතක් අමුණන්න

1.7 පෞද්ගලික විද්‍යුත් ලිපිනය (තිබේ නම්) : වලංගු විද්‍යුත් ලිපිනයක් විය යුතුය.

1.8 ව්‍යවසායට අදාළ ඉහළ ම වෘත්තීය සුදුසුකම් (NVQ හෝ වෙනත් පිළිගත හැකි සුදුසුකම්) : (සහතික කළ ඡායා පිටපතක් අමුණන්න)

### 02. ව්‍යවසාය පිළිබඳ මූලික තොරතුරු

2.1 ව්‍යවසායේ නම: ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සඳහන් පරිදි ව්‍යවසාය ලියාපදිංචියේ දී සඳහන් කර ඇති ආකාරයට (ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කළ ඡායා පිටපතක් අමුණන්න.)

2.3 ව්‍යවසාය හිමිකම : ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සඳහන් පරිදි

2.4 හවුල් ව්‍යවසායක් නම්, හිමිකරුවන්ගේ නම් ජාතික හැඳුනුම්පතේ ඇති ආකාරයට

(හැඳුනුම්පත්වල සහතික කළ ඡායා පිටපත් අමුණන්න.)

2.5 ව්‍යවසාය ලියාපදිංචි කර ඇති ආයතනය :

පහත ආයතන අතුරින් එක් ආයතනයක් විය යුතුයි.

a) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
b) බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
c) බස්නාහිර පළාත් සභාවට අයත් දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක්
d) ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
e) ව්‍යවසායට අදාළව අවසර ලබාගත යුතු වෙනත් රාජ්‍ය ආයතනයක් හෝ අර්ධ රාජ්‍ය ආයතනයක්

**03.ව්‍යවසාය පිළිබඳ සාරාංශ**

3.1 ව්‍යවසාය අයත් වන ක්ෂේත්‍රය : පහත ක්ෂේත්‍රවලින් එකක් දක්වන්න.

- කෘෂි ආශ්‍රිත නිෂ්පාදන හෝ අගය එකතු කළ නිෂ්පාදන
- සත්ත්ව නිෂ්පාදන හෝ අගය එකතු කළ නිෂ්පාදන
- විසිතුරු මත්ස්‍ය වගාව හා ඒ ආශ්‍රිත ව්‍යවසාය
- සුළු පරිමාණ ඇඟලුම් ආශ්‍රිත නිෂ්පාදන
- සුළු පරිමාණ සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන
- සාම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන
- දේශීය කුළුබඩු ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන
- විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය
- සබන් හා සේදුම් කාරක නිෂ්පාදන
- සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
- ආයුර්වේද ආශ්‍රිත නිෂ්පාදන
- ලුහු කර්මාන්ත
- දේශීය අමුද්‍රව්‍ය භාවිත කර ආහාර නිෂ්පාදනය
- නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය ආශ්‍රිත ව්‍යවසාය
- වාහන අලුත්වැඩියාව ආශ්‍රිත ව්‍යවසාය
- දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින් අපනයනය ඉලක්ක කරන නිෂ්පාදන
- දේශීය හා විදේශීය සංචාරකයින් ඉලක්ක කරගත් නිෂ්පාදන ව්‍යවසාය
- ණය කළමනාකරණ කමිටුව විසින් පිළිගන්නා වෙනත් නිෂ්පාදන ව්‍යවසාය

3.2 ව්‍යවසාය මගින් සපයන නිෂ්පාදන හෝ සේවා : ඔබගේ සියලු නිෂ්පාදන සඳහන් කරන්න. උදා: ව්‍යවසාය අයත් වන ක්ෂේත්‍රය සුළු පරිමාණ සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන නම්, නිෂ්පාදන පාවහන්, බෑග් ආදී ලෙස දක්වන්න.

3.3.1 දේශීයව අලෙවි කරන / සේවා සපයන ප්‍රදේශ : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස / දිස්ත්‍රික්ක වශයෙන් දක්වන්න

3.3.3 අපනයනකරුවෙකුට නිෂ්පාදන අලෙවි කරන්නේ ද? පිළිතුර ‘‘ඔව්’’ නම් අදාළ අපනයනකරුගේ නම සහ ලිපිනය සඳහන් කරන්න.

3.4 ව්‍යවසාය සඳහා දේශීයව සපයා ගන්නා අමුද්‍රව්‍ය භාවිත කරන්නේ ද ? ඔව් / නැත

ඉහත පිළිතුර ‘‘ඔව්’’ නම් එම අමුද්‍රව්‍ය සඳහන් කරන්න. මාසිකව ඔබ විසින් භාවිත කරනු ලබන අමුද්‍රව්‍ය ප්‍රමාණයන් දක්වන්න.

3.5.3. ව්‍යවසාය සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි කර ඇති බවට ඇති සහතිකයේ, සහතික කළ පිටපතක් අමුණන්න.

**04.ව්‍යවසාය සඳහා සිදුකරන ලද මූලික ආයෝජනය**

| අනු අංකය | මූලික ආයෝජන | ප්‍රමාණය / සංඛ්‍යාව | දළ වටිනාකම (රු.) |
|---|---|---|---|
| I | ඉඩම් | අක්කර/රූඩ්/පර්චස් වලින් දක්වන්න. | |
| II | ගොඩනැගිලි | වර්ග අඩි හෝ වර්ග මීටර් වලින් දක්වන්න. | |
| III | යන්ත්‍රසූත්‍ර/උපකරණ | එක් එක් යන්ත්‍රයේ නම සහ ඒවායින් කොපමණ ප්‍රමාණයක් පවතින්නේ ද? යන්න දක්වන්න. | |
| IV | වාහන (ව්‍යවසායට අදාළව) | වාහන වර්ගය දක්වන්න | |
| V | කාරක ප්‍රාග්ධනය | | |
| VI | වෙනත් (සඳහන් කරන්න) | | |
| **එකතුව** | | | |

**05. 2026 වර්ෂයේ ජනවාරි 01 දින සිට ජුනි 30 දින දක්වා මාස 06 ක ආදායම් සාරාංශය:** උදාහරණය පරිදි ව්‍යවසායේ ආදායම් ලැබීම් සඳහන් කරන්න.

| **අනු අංකය** | **නිෂ්පාදනය හෝ සේවාව** | **නිෂ්පාදනය / විකුණුම් ඒකක (මාස 06 ක් සඳහා)** | **ඒකකයක විකුණුම් මිල (රු.) (මාස 06 ක් සඳහා)** | **මුළු ආදායම (රු) (මාස 06 ක් සඳහා)** |
|---|---|---|---|---|
| I | ළදරු ඇඳුම් | 3000 | 450.00 | 1,350,000.00 |
| II | ළදරු පාවහන් | 2400 | 300.00 | 720,000.00 |
| III | | | | |
| **එකතුව** | | | | **2,070,000.00** |

7.1 ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සිදුකරන ඉල්ලීම් : ව්‍යවසායන්ට අදාළව නිෂ්පාදන සිදුකිරීම සඳහා අත්‍යවශ්‍ය වන ගොඩනැගිලි සඳහා පමණක් සලකා බලනු ලැබේ. අනිවාර්යයෙන් එහි දළ සැලැස්මක් සමග BOQ (Bill of Quantity) ඉදිරිපත් කළ යුතුය.

7.2 ණය අවශ්‍යතාවට අදාළ විස්තර

| ණය අවශ්‍යතාව | | මිලදී ගැනීමට යෝජිත යන්ත්‍ර / උපකරණ නාමය | වෙළඳපොළ වටිනාකම (රු.) | යෝජිත යන්ත්‍රයේ හෝ උපකරණ පිරිවිතර (specifications) |
|---|---|---|---|---|
| 1 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිලදී ගැනීම | උදා - විජලන යන්ත්‍රයක් | | බලය, තැටි ප්‍රමාණය, වෝල්ටීයතාව, එක් වරකට විජලනය කළ හැකි ප්‍රමාණය (Kg) ආදී |
| | | 1.1 | | |
| | | 1.2 | | |
| **ණය අවශ්‍යතාව** | | **ස්වභාවය** | **ප්‍රමාණය** | **ඇස්තමේන්තු වටිනාකම රු.** |
| 3 | ව්‍යවසාය සඳහා අවශ්‍ය වන විශේෂිත ගොඩනැඟිලි ඉදිකිරීම් / නවීකරණය / වැඩිදියුණු කිරීම් | උදා - කොටසක් එකතු කිරීම | 20*30 | |

7.7 ඉහත සඳහන් කරන ලද කාර්ය / කාර්යයන් සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීම තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂිත තත්ත්වය : මේ යටතේ ඔබගේ ව්‍යවසායේ ඉදිරි ඉලක්ක සඳහන් කළ යුතු වේ.

| අනු අංකය | නිෂ්පාදන වර්ගය | අපේක්ෂිත නිෂ්පාදන ඒකක ප්‍රමාණය (වාර්ෂික) | | |
|---|---|---|---|---|
| | | 2027 | 2028 | 2029 |
| | උදා : ළදරු ඇඳුම් | ළදරු ඇඳුම් සංඛ්‍යාව | | |
| | වාහන අලුත්වැඩියා කිරීම | (අලුත්වැඩියා කිරීමට ඉලක්ක කරන වාහන සංඛ්‍යාව) | | |

**08. ව්‍යවසායකයාගේ පදිංචිය සනාථ කිරීම :**

8.1 සියලුම අයදුම්කරුවන් විසින් පදිංචිය සනාථ කර ගත යුතුය.

8.2 ව්‍යවසාය ස්ථාපිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා පදිංචිය එක ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වනවිට අනු අංක 8.2ට අදාළ තොරතුරු පිරවීම අවශ්‍ය නොවේ.